# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ආයතන චක්‍රලේඛ ලිපි අංක : 15/2014**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, දෙසැම්බර් මස 19 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2014 අදාළ කර ගැනීම</u>

2014.12.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2014 -"ශ්‍රී ලංකාව ආසියාවේ නැගී එන ආර්ථිකයක් ලෙස ඔසවා තැබීමේ සද්කාර්යයට උරදෙමු" මැයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් වැඩසටහන 2015.01.01 දින ඔබගේ කාර්යාල පරිශ්‍රයේදී අනුගමනය කරන මෙන් කරුණාවෙන් දන්වා සිටිමි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2014 හි පිටපතක් දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා මෙ සමග අමුණා ඇත.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යු.ජී.සී./එච්.ආර්./10/1/1

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 28/2014

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.12.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## <u>ශ්‍රී ලංකාව ආසියාවේ නැගී එන ආර්ථිකයක් ලෙස ඔසවා තැබීමේ සද්කාර්යයට උරදෙමු</u>

"මතු පරපුර වෙනුවෙන් ජාතික සමඟිය තහවුරු කරමින් සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා කැපවෙමු" මැයෙන් 2013.12.23 වෙනි දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/2013 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ශ්‍රී ලංකාව ආසියාවේ නැගී එන ආර්ථිකයක් ලෙස ගමන් කරවීමේ කාර්යයට කැපවීම සඳහා වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් සියලුම රාජ්‍ය සේවකයන් තුළ ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 2015 වසරේ වැඩ කරන පළමු දිනය වන 2015 ජනවාරි මස 01 වන බ්‍රහස්පතින්දා සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

03. එහි ප්‍රධාන නිල උත්සවය ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එදින පෙ.ව.9.00 ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වේලාවටම මෙම වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලුම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ යොදා ගත යුතු වේ.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම. (සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් එක් තැනකට ඒකරාශී කරවීමට බාධා පමුණුවන ඉඩකඩ පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත් සෑම සාමාජිකයෙකුගේම සහභාගිත්වය සහතික කෙරෙන පරිදි සුදුසු විකල්ප වැඩපිළිවෙළක් යොදා ගත හැකි ය.)

II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු දෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

IV. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් (මේ සමඟ එවා ඇති) රාජ්‍ය සේවා ප්‍රතිඥාව/දිවුරුම හඬනගා කියවීම.

V. මෙම වැඩපිළිවෙළෙහි අවසාන අංගය ලෙස ආයතනයේ ප්‍රධානියා විසින් ශ්‍රී ලංකාව ආසියාවේ නැගීගෙන එන ආර්ථිකයක් ලෙස ගමන් කරවීමේ කාර්යය සඳහා කාර්ය මණ්ඩලයේ සෑම දෙනාගේම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමකින් යුතුව ලබා දීමේ අවශ්‍යතාව තේමා කර ගත් කෙටි දේශනයක් පැවැත්වීම.

04. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

## රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/දිවුරුම

වර්ෂ දෙදහස් පහළවක් වූ ජනවාරි මස පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ලක්වැසි ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කරන

නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ එක කොඩියක සෙවනේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන මාතෘ භූමිය

සංවර්ධනය කිරීමේ දැවැන්ත අභියෝගය ජයගැනීම සඳහාත්

ශ්‍රී ලංකාව ආසියාවේ නැගී එන ආර්ථිකයක් ලෙස

ගමන් කරවීමේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහාත්

මහජන මුදලින් වැටුප් ලබන රාජ්‍ය සේවකයෙක් වන මම,

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/දිවිරුම් දෙමි.